# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1997 / 4 - 2016 දෙසැම්බර් 14 වැනි බදාදා - 2016.12.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

**අවසාන නියෝග**

**ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත**

## නිරවුල් කිරීමේ ආඥාව අංක 145 (වව්නියාව)

උතුරු පළාතේ වව්නියාව දිස්ත්‍රික්කයේ වව්නියාව දකුණ (දෙමළ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ (දැනට වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ) ප්‍රදේශයක පිහිටියා වූද, අංක 75 (උතුර) දරණ ලංකා මැනීමේ හූ ලක්ෂනාත්මක සැලැස්මේ අංක 241 යන බිම් කට්ටිය වශයෙන් විස්තරකොට දැක්වෙන ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතේ 4වන වගන්තිය යටතේ නිරවුල් කිරීමේ දැන්වීමක් 1979 නොවැම්බර් මස 23 වැනි දින අංක 64 දරණ රජයේ ගැසට් පත්‍රයේ (අංක 4876 (වව්නියාව) දරණ නිරවුල් කිරීමේ දැන්වීම බලනු) සහ ඉහත කී වගන්තියෙන් නියමිත අන්අයුරින් ද නිසි පරිදි ප්‍රසිද්ධ කරනු ලැබූ හෙයින් ද :

එසේම එකී දැන්වීම අනුව භාරගනු ලැබූ සියලු අයිතිවාසිකම් පිළිබඳව එකී ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර තිබෙන හෙයින් ද :

මෙහි පහත අත්සන් කරන මම එකී ආඥා පනතේ 5(5) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ඉඩම් හෝ ඒවායේ කොටස් මේ ආඥාවේ උපලේඛනයෙහි නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති පරිදි නිරවුල් කරනු ලබන බවට ආඥාවක් මෙයින් නිකුත් කර සිටිමි.

**ඩී.එම්.එම්. දිසානායක**
**නිරවුල් කිරීමේ සහකාර නිලධාරි**
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්.

2016 ඔක්තෝබර් මස 11 වැනි දින,
බත්තරමුල්ල,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

1 A - G 024715 - 37 (2016 / 12)

*සැ.යු.-* මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

| බිම් කට්ටි අංකය | අනු බිම් කට්ටි අංකය | ප්‍රමාණය අ. | රූ. | ප. | පිඹුරු පත්‍රයේ අංකය | නිරවුල් කළේ කවර උප වගන්තිය යටතේද යනවග | නිරවුල් කොට දෙන ලද්දේ කවුරුන්ට ද යන වග | වෙනත් කරුණු (කොටස්, සම්බන්ධකම්, බැඳීම්, අධිකරණයට ඉදිරිපත්කර ඇති නඩුවල අංක, යනාදිය) | ඉඩම් ලියාපදිංචි කරන ලද ලියාපදිංචි කිරීමේ කාර්යාලය | වෙළුම් අංකය | පත්ඉරු අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 241 | _ | 2789 | 2 | 20 | _ | 5(1) | රජය සතුයි | _ | _ | _ | _ |

<u>ඉඩම් නිරවුල්කිරීමේ ආඥා පනත සහතිකය.</u>

ප්‍රමාණයෙන් අක්කර දහයකට අධික ඉඩමකට හෝ ඉඩම්වල එකතුවකට අදාළ වන පමණට ඉහත සඳහන් නිරවුල් කිරීමේ ආඥාවේ අන්තර්ගත නිරවුල් කිරීම් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා අනුමැතිය ප්‍රකාශකර ඇති බව මෙයින් සහතික කරනු ලැබේ.

**රියාසා එම්. නෞෆල්**
සහකාර ලේකම් (ඉඩම්)
ඉඩම් අමාත්‍යාංශය

2016 නොවැම්බර් මස 10 වන දින
බත්තරමුල්ල දීය.

12 - 1104